චක්‍රලේඛ අංක : 04/2011 (11)

මගේ අංකය : බප/සසේකො/6-චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප.),
121/3, කිරුළපන මාවත,
කොළඹ 05.

2015-02- 24

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල,
ස.ණ.ස. සමිති සහ ස.ණ.ස. සංගම්වල ගරු සභාපතිවරුන් වෙත ,

**<u>බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2010 වැටුප් චක්‍රලේඛය ක්‍රියාත්මකවීමත් සමඟ අනුගමනය කළ යුතු සමුපකාර සේවකයින්ගේ උසස්වීම් පටිපාටිය හා විෂමතා ඉවත් කිරීම.</u>**

බස්නාහිර පළාත් සමුපකාර සේවකයින් සඳහා වැටුප් පරිමාණ ප්‍රතිශෝධනය කරමින් නිකුත් කරන ලද 02/2010 චක්‍රලේඛය යටතේ සියළුම සමුපකාර සේවකයින් 111 ශ්‍රේණියේ පිහිටුවීමට විධිවිධාන සලස්වනු ලැබූ අතර, එමඟින් ඇති වූ සේවක වැටුප් විෂමතාවයන් ඉවත් කිරීමේ අරමුණින් 04/2011 චක්‍රලේඛය නිකුත් කර ඇත.

02. එම 04/2011 චක්‍රලේඛය යටතේ බහුතරයක් සේවක පිරිසකගේ වැටුප් විෂමතා ඉවත් කිරීමේ කාර්යය මේ වන විට නිම කර ඇත. සුදුසුකම් ලබන ඉතිරි සුළු පිරිස ගේ වැටුප් විෂමතා ඉවත් කිරීමේ කාර්යය ද 2015-04-01 දින වන විට අවසන් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

03. එහෙත්, චක්‍රලේඛය නිකුත් කිරීමේ අරමුණ නියමාකාරයෙන් සාක්ෂාත් නොවූ අවස්ථාවන් සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත කරුණු වාර්තා විය. ඒ පිළිබඳව වැඩිදුර තොරතුරු, විධිමත් පරිදි රැස් කර ගැනීමෙන් අනතුරුව, චක්‍රලේඛයේ පවතින පොදු ගැටළු කිහිපයක් හඳුනාගන්නා ලදී. එම ගැටළු හැකිතාක් අවම කිරීමේ අරමුණින් සහ 2011-09-19 දිනැති 04/2011 චක්‍රලේඛයට සහ 2011-11-14 දිනැති 04/2011(1) චක්‍රලේඛයට වැඩිමනත් වශයෙන්, 2010-04-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත විධිවිධාන පනවනු ලැබේ.

04. මේ වනවිට බොහෝ සේවක පිරිසකගේ වැටුප් විෂමතා ඉවත් කිරීමට අවශ්‍ය ශ්‍රේණිගත කිරීම් කටයුතු සාර්ථක ලෙස සිදු කර ඇති නිසා, දැනටමත් කොමිෂන් සභා අනුමැතිය මත ශ්‍රේණිගත වූ සේවකයින් හට නැවත වැටුප් විෂමතාවයක් ඇතිවීම වැළැක්වීම කෙරෙහි මෙහිදී විශේෂ අවධානයක් යොමු කරනු ලැබූ බව ද කාරුණිකව සලකන්න.

05. (අ) චක්‍රලේඛ අංක : 04/2011 යටතේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ කමිටුව මඟින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබූ, එහෙත් අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම හේතුවෙන් වැටුප් විෂමතා ඉවත් නොවීම පිළිබඳ ගැටළු පවතින සේවකයින් සඳහා, පසුගිය ආසන්න වසර පහක කාලය තුළ වැටුප් වර්ධක උපයා ගෙන තිබීම පිළිබඳ අවශ්‍යතාවය පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

i. විනය පරීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙන්, විනය නියෝගයක් මත වැටුප් වර්ධක විලම්භනය වූ හෝ වෙනත් බරපතල දඬුවම් ලබා තිබෙන සේවකයින් හට මෙම වැටුප් විෂමතා ඉවත්කිරීම සඳහා හිමිකම් ප්‍රකාශ කල නොහැකිය.

ii. ඉහත (i) සඳහන් ආකාරයේ විනය නියෝගයක් මත හැර වෙනත් කිසියම් හේතුවක් කරණ කොට ගෙන, පූර්වාසන්න වර්ෂ 05 තුළ වැටුප් වර්ධක උපයා ගැනීමට අසමත් වූ සේවකයින්, එසේ වැටුප් වර්ධක උපයා නොගැනීමට හේතු වූයේ ,

(අ) සේවකයාගෙන් සමිතිය වෙත අයවිය යුතු කිසියම් අලාභයක් හෝ ගෙවීමක් සම්බන්ධයෙන් නම්, එම අලාභය හෝ ගෙවීම සම්පූර්ණයෙන් පියවීමෙන් පසු හෝ,

(ආ) කාර්යසාධනය සම්බන්ධයෙන් පවතින ගැටළුවක් සම්බන්ධයෙන් නම්, එම අසතුටුදායක කාර්යසාධන තත්ත්වය මේ වන විට නිවැරදි කර ගෙන ඇත්නම් හෝ,

එම සේවකයා / සේවිකාව මෙම වැටුප් විෂමතා ඉවත් කිරීමේ කාර්යය සඳහා සුදුසුකම් ලබයි.

(ඇ) ඒ අනුව, ඉහත (අ) , (ආ) කරුණු සම්බන්ධයෙන් නියමිත සුදුසුකම් සපුරාලීම පිළිබඳව සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය ආසන්න වර්ෂ 05 තුළ උපයා නොගත් වැටුප් වර්ධක නැවත ප්‍රදානය කිරීමට තීරණය කරනු ලබන්නේ නම්, එය ලිඛිතව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඇ) ආසන්න පූර්ව වර්ෂ 05 තුළ වෙනත් තනතුරකට හෝ ශ්‍රේණියකට උසස්වීම් ලැබීම හේතුවෙන් වැටුප් විෂමතා ඉවත් කිරීම අහිමි වූ සේවකයින් සහ, වෙනත් ගැටළු පවතින සේවකයින්ගේ පෞද්ගලික ලිපිගොනු, අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සමඟ අනෙකුත් සේවකයින්ගේ ජ්‍යෙෂ්ඨතාවයට හානියක් නොවන පරිදි සහනයක් සැලසීමට හැකි දැයි පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ද සහිතව පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත වන කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත ලිඛිත ඉල්ලීමක් කළ යුතු වේ.

කමිටුවේ සංයුතිය :

i. කොමිෂන් සභාවේ ලේකම් හෝ ඔහු විසින් පත් කරනු ලබන නියෝජිතයෙකු
ii. අදාල සමිතියේ සභාපතිවරයා / සභාපතිවරයා විසින් බලය පැවරූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක්
iii. අදාල සමිතියේ සාමාන්‍යාධිකාරී / පිරිස් කළමනාකරු
iv. වැටුප් විෂමතා ඉවත් නොවීම පිළිබඳ ගැටළුව පවතින අදාල සේවකයා / සේවිකාව

ඉහත කමිටුව කොමිෂන් සභා කාර්යාල පරිශ්‍රය තුළ රැස් වන අතර, ලිඛිත ඉල්ලීමක් මඟින් ඒ සඳහා දිනයක් වෙන් කර ගත යුතුය. මෙම කමිටුවේ නිර්දේශ මත කොමිෂන් සභාව විසින් අදාල සේවකයින්ගේ ශ්‍රේණිගත කිරීමේ ගැටළු සම්බන්ධයෙන් නියමයන් නිකුත් කරනු ඇත.

06. මෙතෙක්, 04/2011 චක්‍රලේඛය යටතේ විෂමතා ඉවත් කර නොමැති සේවකයින්, පහත දැක්වෙන සුදුසුකම් පරීක්ෂා කිරීමේ කමිටුවේ නිර්දේශ සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සමඟ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

i. වැටුප් විෂමතා ඉවත් කිරීමේ සේවක සුදුසුකම් පරීක්ෂා කිරීමට පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ගැනීමට සමිතිය විසින් කටයුතු කළ යුතු වේ.

කමිටුවේ සංයුතිය :

අ) සමිතියේ සභාපති/සභාපතිවරයා විසින් බලය පැවරූ උප සභාපති හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙක්
ආ) සමුපකාර සංවර්ධන නිලධාරී
ඇ) සමුපකාර කොමිෂන් සභා නියෝජිත නිලධාරී
ඇ)සමිතියේ සාමාන්‍යාධිකාරී
ඉ) මානව සම්පත් කළමනාකරු

ii. ඉහත 06 - i යටතේ පත් කරනු ලබන කමිටුවක එක් එක් සාමාජිකයෙකු සඳහා, පරීක්ෂා කරනු ලබන එක් පෞද්ගලික ලිපිගොනුවක් සඳහා රු.50/- බැගින්, උපරිම දෛනික දීමනාව රු.2,500/- කට ද, අවම දෛනික දීමනාව රු.1,000/- කට ද යටත්ව ගෙවීම් කිරීම අනුමත කරනු ලැබේ.

iii. 04/2011 චක්‍රලේඛය යටතේ මෙතෙක් වැටුප් විෂමතා ඉවත් කරනු නොලැබූ සියළුම සේවකයින්ගේ ශ්‍රේණිගත කිරීමේ කාර්යයන් 2015-04-01 දින වන විට සිදු කර අවසන් කිරීම මෙම චක්‍රලේඛයෙන් වැඩිදුරටත් අපේක්ෂා කරනු ලැබේ.

කොමිෂන් සභා නියමය පරිදිය.

ඩබ්. පී. එම්. ජී. ආර්. ශාන්ත කුමාර මුහන්දිරම්,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් : 01. ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත.
02. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය -.අමාත්‍යාංශය - බස්නාහිර පළාත.
03. සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර් - බස්නාහිර පළාත.
04. අධ්‍යක්ෂ, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - බස්නාහිර පළාත.
05. ලේකම්, සමුපකාර සමුපකාර සේවක කොමිෂන් සභාව.
06. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
07. සියළුම වෘත්තීය සමිති සංගම්